" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
## OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/18
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2020.12.17

<u>**මූල්‍ය චක්‍රලේඛ 08/2020**</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

<u>**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**</u>
<u>**රාජ්‍ය ආයතනවලට අයත් ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම.**</u>

රාජ්‍ය ආයතනවලට අයත් වාහන විශාල ප්‍රමාණයක් නිසි පරිදි නඩත්තු කිරීමකින් තොරව විවිධ ස්ථානවල ගාල්කර තිබෙන බව නිරීක්ෂණය වන බැවින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුලු සියලු රාජ්‍ය ආයතනවල ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම කඩිනමින් සිදු කල යුතු බව 2020 සැප්තැම්බර් 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව සියලුම රාජ්‍ය ආයතනවලට අයත් නිසි පරිදි නඩත්තු කිරීමකින් තොරව ගාල් කර තිබෙන වාහන සම්බන්ධයෙන් අදාල ආයතන ප්‍රධානීන් විසින් පහත සඳහන් පරිදි කටයුතු කල යුතුවේ.

**අ). ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කිරීම.**

2015.08.24 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 09/2015 මඟින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් ධාවන තත්ත්වයේ නොපවතින වාහන 2021.02.28 දිනය පෙර අපහරණය කල යුතුවේ. පළාත් සභා අරමුදල් භාවිතා කරන ආයතන එම වාහන අපහරණය කිරීමෙන් උපයන මුදල් අදාල අරමුදල්වලට පහත පරිදි බැර කල යුතුවේ.

I අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක සතු එවැනි මෝටර් වාහන අපහරණය කිරීමෙන් ලැබෙන මුදල් පළාත් අරමුදලට බැර කිරීම. අයවැය ප්‍රතිපාදන මඟින් මුදල් සපයනු ලබන රජයේ අනෙකුත් සියලුම ආයතනවල එවැනි ලැබීම්ද පළාත් අරමුදලට බැර කල යුතුවේ.

**ආ).ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කිරීම.**

2015.08.24 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක09/2015 හි 05 ඡේදයේ සඳහන් පරිදි අපහරණය කිරීම සඳහා සුදුසු වාහන හඳුනාගැනීමෙන් පසුව අලුත්වැඩියා කර භාවිතා කිරීම ඵලදායී වන වාහන ලෙස හඳුනාගනු ලබන දැනට ධාවන තත්ත්වයේ නොමැති පළාත් සභා හා පළාත් සභාවලට අයත් ආයතන සතු එවැනි වාහන පළාත් සභා අරමුදල් භාවිතා කරමින් 2021.03.15 දිනට පෙර අලුත්වැඩියා කල යුතු වේ.

03. ඉහත 02 හි සඳහන් පරිදි අපහරණය කල හෝ අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු 2021.03.31 දිනට පෙර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත මේ සමඟ ඇති ඇමුණුම 01 හි සඳහන් පරිදි ඉදිරිපත් කල යුතුවේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම්,
හා පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති.

02. ප්‍රධාන නීති නිලධාරී

03.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

04.තොරතුරු තාක්ෂණ නිලධාරී.

ඇමුණුම 01

## ධාවන තත්ත්වයේ නොපැවති අපහරණය කල හෝ අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු මූල්‍ය චක්‍රලේඛ අංක 08/2020 අනුව ඉදිරිපත් කිරීම.

(පහත තොරතුරු ෆැක්ස් අංක 011-2092609 වෙතද, Excel මෘදු පිටපත dcsadmin@cs.wpc.gov.lk

විද්‍යුත් ලිපිනය වෙතද ඉදිරිපත් කල යුතුවේ.)

**01.** අපහරණය කල වාහන පිළිබඳ තොරතුරු.

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන පංතිය (Car, double Cab etc..) | වර්ගය (Make) (Toyota, Nissan etc..) | මාදිලිය (Model) (Corolla, Sunny etc..) | නිශ්පාදිත වර්ෂය | අපහරණය කිරීම.(√) | | අපහරණයෙන් ඉපයූ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වාහන ලෙස | සුන්බුන් ලෙස | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

........................................................ ....................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව. දිනය

**02.** අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු.

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන පංතිය (Car, double Cab etc..) | වර්ගය (Make) (Toyota, Nissan etc..) | මාදිලිය (Model) (Corolla, Sunny etc..) | නිශ්පාදිත වර්ෂය | අලුත්වැඩියාව සඳහා වැය වූ මුදල රු. |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

........................................................ ....................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව. දිනය